
**Starter motor solenoid පරීක්ෂා කිරීම**


solenoid එක ඉවතට නොගලවා පරීක්ෂා පරීක්ෂා කිරීම :

මෙහිදී solenoid එකෙහි ක්‍රියාකාරිත්වයන් වන Pinion gear සහ Fly wheel gear සම්බන්ධ කිරීම, Solenoid winding එකෙහි අභ්‍යන්තර winding වල ක්‍රියාකාරිත්වයන් සියල්ල පරීක්ෂා කර ගත හැක.




**පියවර 1 :**

පරිපථයෙහි ආකාරයට මෝටර් බඳට සහ Solenoid එකෙහි M අග්‍රයට 12V ඍණ සැපයුමක් සම්බන්ධ කළ යුතුයි. ඉන්පසුව 50 අග්‍රයට 12V ධන සැපයුමක් සම්බන්ධ කල විට Pull-in සහ hold-in winding දෙකම ක්‍රියාත්මක වන බැවින් Plunger එක අභ්‍යන්තරයට ඇද ගන්නා අතර pinion gear ඉදිරියට ගමන් කරන බව නිරීක්ෂණය කල හැක.




**පියවර් 2 :**

ඉහත ලෙසින් පරිපථය ක්‍රියාත්මක වන විට M අග්‍රයට සම්බන්ධ කළ සෘණ අග්‍රය විසන්ධි කළ සැනින් Pull-in winding එක අක්‍රිය වන අතර hold-in winding එක තවදුරටත් ක්‍රියාත්මක වේ. එම නිසා අභ්‍යන්තරයට ඇදගත් Plunger එක රඳවා තබාගෙන සිටී.



**පියවර 3 :**

ඉන්පසුව බොඩියට සම්බන්ධ කර තිබූ සෘණ අග්‍රය ඉවත් කළ සැනින් Plunger එක ඉවතට ගමන් කරන අතර pinion ගියරය අභ්‍යන්තරයට ගමන් කරන බව නිරීක්ෂණය කළ හැක.



## හාරයක් නොමැති අවස්ථාවේදී මෝටරය ලබාගන්නා ධාරාව පරීක්ෂා කිරීම.

පහත ලෙසින් වැඩි ධාරාවක් ගමන් කළ හැකි වයරයන් යොදාගනිමින් 12V බැටරියක් සෘණ අග්‍රය මෝටරයේ බඳටද ධන අග්‍රය +B අග්‍රයටද සම්බන්ධ කර 50 අග්‍රයට ධන සැපයුමක් සම්බන්ධ කළ පසු මෝටරය ක්‍රියාත්මක වන බව නිරීක්ෂණය කළ හැක..

එහිදී මෝටරයේ ධන අග්‍රය සම්බන්ධ වයරයට ශ්‍රේණිගතව ඇම්පියර් මීටරයක් සම්බන්ධ කළ විට මෝටර් ලබාගන්නා ධාරාවද පරීක්ෂා කළ හැක.

